**10 ශ්‍රේණිය විෂය :පුරවැසි අධ්‍යයනය**

**පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ**

**පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

1)

i. පාලන ක්‍රමයක් ලෙස සෘජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක කිරිමේදි මතුවන ගැටළු දෙකක් ලියන්න.

ii. ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමයක ලක්ෂණ දෙකක් ලියන්න.

iii. අතීතයේ පටන් ලෝකයේ විවිධ රාජ්‍යයන් පාලනය කිරිම සඳහා භාවිතා කරන ලද පාලන ක්‍රම දෙකක් ලියන්න.

iv. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදි පාලන ක්‍රමයක් පවතින රටවල් දෙකක් නම් කරන්න.

v. සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වු ග්‍රීක නගර රාජ්‍යයන් දෙකක් නම් කරන්න.

vi. ප්‍රජාතන්ත්‍රවාදි පාලන ක්‍රමයක දැකිය හැකි ප්‍රධාන ස්වරූප නම් කරන්න.

vii. ශ්‍රී ලංකික ජනතාවට පාලනයට සම්බන්ධ වීමට ලැබෙන අවස්ථා දෙකක් සඳහන් කරන්න.

viii. නූතන රාජ්‍ය තුළින් හඳුනාගත හැකි පක්ෂ ක්‍රමයේ ස්වරූප දෙකක් නම් කරන්න.

ix. දකුණු පළාත අයත් දිස්ත්‍රික්ක දෙකක් නම් කරන්න.

x. ජාතික රාජ්‍ය බිහිවීමට බලපෑ හේතු දෙකක් නම් කරන්න.

(ල 20 )

02)

i. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ චින්තකයින් දෙදෙනෙකු නම් කරන්න. (ල 2 )

ii. වර්තමාන ප්‍රජාතන්ත්‍රවාදි රාජ්‍ය තුළ දැකිය හැකි සප්ත අපරිහානි ධර්ම තුනක් නම්කරන්න (ල 3 )

iii. ප්‍රජාතන්ත්‍රවාදය පාලන ක්‍රමයක් ලෙස වැදගත් වන ආකාරය කරුණු තුනක් මගින් පෙන්වා දී ඉන් එකක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල 5 )

03)

i. ශ්‍රී ලංකාව මැතිවරණ දිස්ත්‍රික්ක කීයකට බෙදා තිබේද? (ල 2 )

ii. බස්නාහිර පළාතට අයත් මැතිවරණ දිස්ත්‍රික්ක 03 නම් කරන්න. (ල 3 )

iii. නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණ තුනක් නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න (ල 5 )

04)

i. වර්තමානයේ නියෝජිතයින් තෝරා පත්කරගැනිම සඳහා බහුල වශයෙන් අනුගමනය කරනු ලබන නියෝජණ දෙක නම් කරන්න. (ල 2 )

ii. ඡන්ද කොට්ඨාශ අනුව නියෝජිතයින් තෝරා ගැනීම නිසා අත්වන ප්‍රයෝජන තුනක් ලියන්න. (ල 3 )

iii. ප්‍රජාතන්ත්‍රවාදි පාලනය සාර්ථක කර ගැනිම සඳහා විරුද්ධ පක්ෂයෙන් ඉටුවිය යුතු කාර්යයන් තුනක් නම් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල 5 )

05 )

i. යුරෝපයේ බිහි වු ප්‍රථම ජාතික රාජ්‍යයන් දෙක නම් කරන්න (ල 2 )

ii. ජාතික රාජ්‍යය බිහි වීමට බලපෑ හේතු තුනක් නම් කරන්න. (ල 3 )

iii. රාජ්‍යයට පැවරෙන කාරයයන් දෙකක් නම් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල 5 )

06)

i. ව්‍යවස්ථාදායකයේ කාර්යයන් දෙකක් නම් කරන්න. (ල 2 )

ii. පාර්ලිමෙන්තු ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණ තුනක් නම් කරන්න (ල 3 )

iii. ජනාධිපති ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ තුනක් දක්වා ඉන් එකක් පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න.(ල 5 )